Article 12(1)


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-06-04 |

පැමිණිලිකරු : කේ.එච්.ටී විජේරත්න මයා,
380/77, සරණ පාර,
කොළඹ 07.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

02. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/302/18</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, සහෝදර පදනම යටතේ, ආසන්නතා පදනම යටතේ සහ ආදි ශිෂ්‍ය පදනම යටතේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට තම දරුවා ඇතුළත් කිරීමේ අරමුණින් වගඋත්තරකාර විද්‍යාලයට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ බවත්, ආසන්නතා, ආදි ශිෂ්‍ය පදනම හා සහෝදර පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර, සහෝදර පදනම මත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුවද කිසිදු ලකුණක් ලබා නොදුන් බවත්ය.

පැමිණිලිකරු 2019.02.17 වන දින පැවැති පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, සහෝදර පදනම මත පාසලට දරුවන් ඇතුළත් කර ගැනීමේ අවම ලකුණු සීමාව වනුයේ ලකුණු 19 ක් වන අතර, තමාට ලකුණු 21 ක් ලබාගත හැකිව තිබූ බවයි. සහෝදර පදනම මත තම දරුවා ඇතුළත් කරගැනීමේදී තම වැඩිමහල් දරුවා පාසලේ සිටි කාලය සඳහා ලකුණු 08ක්ද, පළමු


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වසරට ඇතුළත් කිරීම සඳහා ලකුණු 05 ක්ද, දරුවාගේ දක්ෂතාවයට ලකුණු 04 ක්ද, දෙමාපියන් පාසලට දැක්වූ දායකත්වය වෙනුවෙන් ලකුණු 04 ක්ද, ලැබිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ මුළු ලකුණු ප්‍රමාණය 21 ක් බව පැමිණිලිකරු කොමිෂන් සභාවට දන්වා ඇත.

සහෝදර පදනම මත පාසලට ළමුන් ඇතුළත් කර ගත් අවම ලකුණු ප්‍රමාණය ලකුණු 19 ක් බවත්, තමන් හට ඉහතින් සඳහන් කරන ලද ලකුණු 21 ලබා දුන්නේ නම් තම දරුවා පාසලට ඇතුළත් කර ගැනීමට හැකියාව ඇති බවත් සඳහන් කර ඇත. එබැවින් තම දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ පළමු වන ශ්‍රේණියට ඇතුළත් කරදෙන මෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුවන් කොමිෂන් සභාව හමුවේ දන්වා ඇත්තේ, පැමිණිලිකරු ආදි ශිෂ්‍ය ගණය යටතේ, සහෝදර පදනම යටතේ හා ආසන්නතා පදනම යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, පැමිණිලිකරුව ආදි ශිෂ්‍ය පදනම මත හා ආසන්නතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර සහෝදර පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලකුණු ලබා දීමක් සිදුකර නොමැති බවත්ය. 22/2017 චක්‍රලේඛය ප්‍රකාරව පැමිණිලිකරුගේ බදු ඔප්පුව ලියාපදිංචි නොමැතිවීම මත ලකුණු ලබාදීමට හැකියාවක් නොමැති බව වගඋත්තරකරුවන් දන්වා ඇත.

2019.02.07 වන දිනැති පරීක්ෂණයේදී ඉහත වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද තම වැඩිමහල් දරුවා පාසලේ සිටි කාලය සඳහා ලකුණු 08 ක්ද, පළමු වසරට ඇතුළත් කිරීම සඳහා ලකුණු 05ක්ද, දරුවාගේ දක්ෂතාවයට ලකුණු 04ක්ද, දෙමාපියන් විසින් පාසලට දැක්වූ දායකත්වය වෙනුවෙන් ලකුණු 04 ක්ද ඒ අනුව මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 21 ක්ද පැමිණිලිකරු හට ලැබිය යුතු බවට පිළිගන්නා බවයි.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු ආසන්නතා පදනම මත, සහෝදර පදනම මත හා ආදි ශිෂ්‍ය පදනම මත අදාළ විද්‍යාලයට අයදුම්පත් යොමුකර ඇති බවට කරුණු අනාවරණය වේ. පැමිණිලිකරු ආදි ශිෂ්‍ය හා ආසන්නතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර, සහෝදර පදනම මත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඇති නමුත්, එහිදී ලකුණු ලබාදීමක් සිදුකර නොමැත.

වගඋත්තරකරුවන් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, සහෝදර පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇතත්, බදු ඔප්පුව ලියාපදිංචි නොවීම මත 22/2017 චක්‍රලේඛ ප්‍රකාරව ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බවයි.

2019.02.07 වන දිනැති පරීක්ෂණයේදී සහෝදර පදනම මත පැමිණිලිකරු වෙත ලබා දී ඇති ලකුණු කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, පැමිණිලිකරුට තම වැඩිමහල් දරුවා වෙනුවෙන් ඉහතින් සඳහන් කරන ලද ලකුණු 2 ක් ලැබිය යුතු බව දෙපාර්ශවයම කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත. තවද, ආසන්නතාවය මූලික සාධකය වන කොට්ඨාශයට අදාළව පහත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කොට ඇත.

මෙහිදී ගයනි ගීතිකා එරෙහිව දිසානායක SCFR 35/2011 නඩු තීන්දුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීම අව්‍යාජව ගොඩනැගීම සඳහා සමුච්චිතිය ප්‍රතිඵලයක් ලබාගැනීමට පළමු ශ්‍රේණිය සඳහා වූ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන සියල්ල සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කළ යුතු බවයි. එසේම පුෂ්පරාජන් රොහාන් එරෙහිව කාරියවසම් SCFR 06/2017 නඩුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින් ඒ මත ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික තීරණයක් බවයි.

ඉහත සඳහන් කරන ලද නඩු තීන්දු ප්‍රකාරව පළමු වසරට දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධ ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින් ඒ මත ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික බව අධිකරණය මගින්ද තීරණය කර ඇත. මේ අනුව පැමිණිලිකරු හට සහනයක් ලබාගැනීමට එම නඩු තීන්දුවද පාදක කර ගැනීමේ හැකියාව පවතී.

නිගමනය :-

මේ අනුව පාසලට සහෝදර පදනම මත දරුවන් ඇතුළත් කර ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 19 ක්ව පැවතියදී හා පැමිණිලිකරු හට සහෝදර පදනම මත එම ලකුණු සීමාව ඉක්මවමින් මුළු ලකුණු 21 ක් ලබාගැනීමට හැකියාව තිබියදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් ලේඛන වලට ලකුණු ලබා නොදීමෙන් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන කේ.එච්.ටී විජේරත්න දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.07.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/